පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සබරගමුව

සති පාසල

අප්‍රේල් මාසය -2 සතිය

විෂය - පෙරදිග සංගීතය

සැකසුම - ගයානි චන්ද්‍රකාන්ති

ශ්‍රේණිය - 9

ර/නිවි/ඇලපාත මහා විද්‍යාලය

Department of Education, Sabaragamuwa Province/ Weekly School

## පුනරීක්ෂණ අභ්‍යාස -2

(1)

i "නිවැරදි ව ස්වර ගායනය හෝ වාදනය හෝ කිරීමේ හැකියාව ලබා ගැනීම, ස්වර අභ්‍යාස පුහුණු වීමෙන් දියුණු කර ගත හැකිය."මෙම කියමන සනාථ කරමින් ස්වර අභ්‍යාස පුහුණුවීමේ වැදගත්කම ඔබේ බසින් පැහැදිලි කරන්න.

ii. ස්වර අභ්‍යාස .......... යනුවෙන් ද හැඳින්වෙන අතර රාගයක භාවිත ශුද්ධ,කෝමල,තීව්‍ර ස්වර එකට මුසු කොට ගත් ස්වර සමූහයන් මගින් රාග නිර්මාණය වී ඇත. මෙම ස්වර කැටි රාග අංග හෙවත් .......... නමින් ද හැඳින්වේ. (ස්වර සංගති/පල්ටා)

iii. බිලාවල් රාගාංග ඇතුළත් වන පරිදි උස්වර අභ්‍යාසයක් ගොඩනගන්න.

(2)

i. රාගයකට අයත් ස්වර භාවිතයෙන් පමණක් නිර්මාණය කොට ඇති ගීත විශේෂය කුමක්ද?

ii. එම ගීත පුහුණුව තුළින් රාගධාරී සංගීතය හදාරන ආධුනිකයෙකුට අත්වන වාසි මොනවාද?

iii. බිලාවල් රාගයේ සර්ගම් ගීතය නියමිත තාල සංඥා සහිතව ප්‍රස්තාර කර දක්වන්න.

(3) නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

රාගයක් ඉපදවීමට ශක්තිය ඇති විශේෂ ස්වර සමුදාය ----------- නමින් හැඳින්වේ. ඒවා ගායනය නොකෙරෙන අතර එමගින් රස උත්පාදනයක් සිදු නොවේ. හින්දුස්ථානී සංගීතයේදී --------------- නමින් ද කර්ණාටක සංගීතයේදී ------------- නමින් ද මෙම පාරිභාෂික වචනය හැඳින්වේ. පණ්ඩිත් --------------- පඬිතුමා මේල ------------ හඳුන්වා දී ඇත.

(මේල/ථාට/විෂ්ණු නාරායන් භාත්ඛණ්ඩේ/10)